# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2011 අංක 10 දරන ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2011 අප්‍රේල් මස 01 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

# 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2011 මාර්තු මස 31 වැනි දින]

එල්. ඩී.— ඕ. 15/2011.

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2011 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මකවන ලෙස සලකනු ලැබිය යුතු ය. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 2 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ "සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක යෙදී සිටින" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ :— 2009 අංක 9 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

"සේවාවක් සැපයීමේ ව්‍යාපාරයක යෙදී සිටින; හෝ

(ඇ) ඉහත (ආ) ඡේදයේ විධිවිධාන අදාළ වන යම් නිෂ්පාදකයකු විසින් එම ද්‍රව්‍ය නිෂ්පාදනය කර විකිණීමක් නොවනතාක් දුරට තොග සහ සිල්ලර වෙළෙඳාම කරනු ලබන.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන ලෙස සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ —

(අ) "සෑම තැනැත්තකුගේම පහත දැක්වෙන" යන වචන සිට "හඳුන්වනු ලබන බද්දක් අයකර ගනු ලැබිය යුතු ය" යන වචන වෙනුවට "සෑම තැනැත්තකුගේම මෙම පනතේ දෙවන උපලේඛනයේ යෝග්‍ය ලෙස දක්වා ඇති අනුප්‍රමාණයන් මත ගණනය කරනු ලබන (මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතිය ගොඩනැගීමේ බද්ද" යනුවෙන් හඳුන්වනු ලබන බද්දක් අයකරගනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීම මගින්;

(ආ) එහි (ii) ඡේදයේ, "(1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, (ඈ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්,".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) එහි (i) වන ඡේදයේ "ආනයනය කිරීමෙන් උපචිත වන 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආනයනය කිරීමෙන් උපචිත වන නමුත් පළමු වන උපලේඛනයේ සඳහන් නිදහස් කරන ලද ද්‍රව්‍ය හැර, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ii) වන ඡේදයේ "එකී තැනැත්තා විසින් නිෂ්පාදනය කරන ලද සෑම ද්‍රව්‍යයක්ම" යන වචන වෙනුවට "එකී තැනැත්තා විසින් නිෂ්පාදනය කරන ලද, පළමු උපලේඛනයේ සඳහන් නිදහස් ද්‍රව්‍ය හැර සෑම ද්‍රව්‍යයක්ම" යන වචන ආදේශ කිරීමෙන්";

(ඇ) එහි (iii) වන ඡේදයේ, "යම් සේවාවක් ශ්‍රී ලංකාව තුළ සැපයීම මගින් ලැබිය යුතු මුදල ලැබුණේ වුවද, නොලැබුණේ වුවද එය ලැබිය යුතු මුදල අදහස් වේ." යන වචන වෙනුවට "පළමු උපලේඛනයේ දක්වා ඇති නිදහස් කරනු ලැබූ සේවා හැර යම් සේවාවක් ශ්‍රී ලංකාව තුළ සැපයීම මගින් ලැබිය යුතු මුදල ලැබුණේ වුවත්, නොලැබුණේ වුව ද, එසේ ලැබිය යුතු මුදල අදහස් වේ;

(iv) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඈ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු සම්බන්ධයෙන් වන විට සහ යම් අදාළ කාර්තුවක් තුළ ලැබූ හෝ නොලැබූ හෝ එම කාර්තුව තුළ භාණ්ඩ විකුණුම්වලින් ලැබිය යුතු වූ මුදල අදහස් වන අතර, පහත දැක්වෙන දේ ඇතුළත් නොවේ —

(1) ඖෂධ වර්ග ;

(2) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතට යටත් වූ යම් භාණ්ඩයක් එම භාණ්ඩයේ ආනයනකරු විසින් තදනන්තරව විකිණීම ; සහ

(3) විදේශ ව්‍යවහාර මුදල් මගින් ගෙවීම් ලැබීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අවසර ලත්, තැනැත්තකු විසින් කරනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ විකුණුම් මත ලැබීම් එම වෙළෙඳාම විදේශ ව්‍යවහාර මුදල් ලැබීම මත කරනු ලැබුවේ නම්.”.

(3) එහි (3) වන උපවගන්තියේ —

(අ) “මේ පනත අදාළ වන (ii) වන හෝ (iii) වන ඡේදවල” යන වචන සහ ඉලක්කම් වෙනුවට “මේ පනත අදාළ වන (ii), (iii) හෝ (iv) වන ඡේදවල” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) මෙහි (iii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදයන් එකතු කිරීමෙන්:—

“(iv) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, ජාත්‍යන්තර ඉසවු සම්බන්ධයෙන් අපනයනය සංවර්ධන ප්‍රදාන යටතේ ගෙවනු ලැබූ යම් ප්‍රදානයක්;

(v) (2010 මැයි මස 12 සිට ක්‍රියාත්මක වන පරිදි) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ජාත්‍යන්තර ඉසවු සම්බන්ධයෙන් වන භාණ්ඩ හා සේවා සැපයීම මත වූ පිරිවැටුම.”.

(4) මෙහි (4) වන උපවගන්තියේ,

(අ) “(1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ සඳහන්” යන වචන සහ ඉලක්කම්

වෙනුවට" (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) එහි (i) වන ඡේදයේ "එම අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ බද්දට යටත් වන පිරිවැටුම" යන වචන වෙනුවට "එම අදාළ කාර්තුව 2011 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භ වන කාර්තුවක් වන විට එම අදාළ කාර්තුව සඳහා ඒ තැනැත්තාගේ බද්දට යටත් වන පිරිවැටුම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (ii) වන ඡේදයේ—

(i) "ඒ තැනැත්තා ඒ අදාළ කාර්තුව සඳහා 2002 අංක 14 දරන" යන වචන හා ඉලක්කම් වෙනුවට "ඒ තැනැත්තා විසින් 2011 ජනවාරි මස 1 වන දිනට පෙර ආරම්භ වූ ඒ අදාළ කාර්තුව සඳහා 2002 අංක 14 දරන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) එහි (ii) වන ඡේදයේ "විකල්ප එකතු කළ අගය මත බද්දක් ගෙවා ඇත්නම්" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් "විකල්ප එකතු කළ අගය මත බද්දක් ගෙවා ඇත්නම්;

(ඈ) මෙහි (ii) වන ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන්:—

(iii) 2011 ජනවාරි මස 1 වන දිනට හෝ එදිනට පසු ආරම්භ වන අදාළ සෑම කාර්තුවකට, යම් තැනැත්තකුගේ (iv) වන සහ (v) වන ඡේදවල සඳහන් භාණ්ඩ හෝ සේවා සැපයුම් නොවන භාණ්ඩ හෝ සේවා සැපයුම්වල යම් බද්දට යටත් පිරිවැටුම, රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන්නේ නම් ; සහ

(iv) එම කාර්තුව 2011 ජනවාරි මස 1 වන දිනට හෝ එයට පසුව ආරම්භ වන කාර්තුවක් වන විට සහ එම අදාළ තැනැත්තාගේ බද්දට යටත් පිරිවැටුම—

(අ) හෝටලයක්, ආගන්තුක නිවාසයක්, භෝජනාගාරයක් හෝ ඒ හා සමාන ව්‍යාපාරයක්;

(ආ) දේශීයව සකසාගත් කෘෂි භෝග වෙළෙඳපලට සකස් කිරීම සම්බන්ධ වූ යම් ක්‍රියාකාරකමක්;

(ඇ) අධ්‍යාපන සේවා සැපයීම සඳහා දේශීයව ස්ථාපනය කරනු ලැබූ අධ්‍යාපන ආයතනයක් විසින් අධ්‍යාපනය සැපයීම; හෝ

(ඈ) මිනිස් ශ්‍රමය සැපයීම වන විට,

එම පිරිවැටුම කාර්තුවකට රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන විට.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ඉවත් කොට පහත දැක්වෙන නව වගන්තිය ආදේශ කිරීම මගින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ:— (ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.)

“බද්ද ගෙවීම. 4. 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, (ඇ) ඡේදයේ හෝ (ඈ) ඡේදයේ සඳහන් තැනැත්තකු වන මේ පනත අදාළ වන සෑම තැනැත්තකුම එම අදාළ කාර්තුව සඳහා කිසිදු තක්සේරු කිරීමක් එම තැනැත්තා පිළිබඳව සිදුකර නැති වුව ද එය නොතකා —

(i) එම කාර්තුවේ පළමු මාසය සඳහා ගෙවිය යුතු බද්ද එම කාර්තුවේ දෙවන මාසයේ විසි වන දින දී හෝ එදිනට පෙර;

(ii) එම කාර්තුවේ දෙවන මාසය සඳහා ගෙවිය යුතු බද්ද එම කාර්තුවේ තුන්වන මාසයේ විසිවන දින දී හෝ එදිනට පෙර;

(iii) එම කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ විසිවන දින දී හෝ එයට පෙර (i) වන සහ (ii) වන ඡේදයන් යටතේ ගෙවන ලද බද්ද අඩු කළ පසු එම කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි බද්ද එම අදාළ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ, විසිවන දින දී හෝ එයට පෙර,

තත්කාර්යය සඳහා කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බදු බැර.

6. මෙම පනත අදාළ වන යම් තැනැත්තෙක්, මෙම පනත යටතේ බදු ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයකුගෙන් ද්‍රව්‍ය මිලදී ගෙන හෝ තමා විසින්ම ආනයනය කරනු ලැබූ ද්‍රව්‍ය බද්දට යටත් වන යම් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා මුලුමනින්ම හෝ කොටසක් භාවිතා කරන විට එසේ භාවිතා කළ ද්‍රව්‍ය මිල දී ගැනීම මත හෝ ආනයනය කිරීම මත ගෙවන ලද බද්ද සඳහා බද්දට යටත් ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා යොදාගනු ලැබූ ද්‍රව්‍යවල වටිනාකමට අනුපාතිකව එහි නිෂ්පාදකයාට බදු බැර හිමි විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනු වලින් ලැබෙන පිරිවැටුම සඳහා බදු අයකළ යුතු බව.

6අ (1) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් පිළිබඳව යම් ව්‍යාපාරයකින් ලැබෙන පිරිවැටුම සඳහා මේ පනතේ විධිවිධාන ප්‍රකාරව බදු අයකරනු ලැබිය යුතු ය.

(2) යම් විශේෂිත ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවක් සඳහා යටත් වන බදු ප්‍රමාණය තීරණය කිරීමේ අරමුණින් දේශීය ආදායම් කොමසාරිස්-ජනරාල්වරයා විසින් —

(අ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකට බලපානු ලබන අවස්ථානුගත කරුණු හඳුනාගැනීමේ කාර්ය සඳහා; සහ

(ආ) යම් ඉස්ලාමීය මූල්‍ය ගනුදෙනුවකින් උපචිතවන ලාභ සහ ආදායම නිශ්චිතව දැනගැනීමේ කාර්ය සඳහා,

නියම කරනු ලැබිය හැකි රීති සහ මාර්ගෝපදේශ කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.”.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කෙරේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) “ද්‍රව්‍යය” යන අර්ථ නිරූපණයේ “යම් භාණ්ඩ, රෙදි හෝ යම් කෘෂිකාර්මික හෝ ගෙවතු නිෂ්පාදන ඇතුළත් වන නමුත් මේ පනතේ උපලේඛන I වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිදහස් කරන ලද යම් ද්‍රව්‍යයක් ඊට ඇතුළත් නොවේ.” යන වචන සහ ඉලක්කම් වෙනුවට “යම් භාණ්ඩ, ද්‍රව්‍ය හෝ යම් කෘෂිකාර්මික හෝ ගෙවතු නිෂ්පාදන ඇතුළත්වන නමුත් 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කිසියම් කාල පරිච්ඡේදයක් සඳහා වන මෙම පනතේ උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දැක්වෙන නිදහස් කරන ලද යම් ද්‍රව්‍යයක් ඊට ඇතුළත් නොවේ” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(2) “සේවා” යන අර්ථකථනය “මේ පනතේ උපලේඛන II වන කොටසේ නිශ්චිතව දැක්වෙන”, යන වචන සහ ඉලක්කම් වෙනුවට “2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ කාල පරිච්ඡේදය සඳහා, මේ පනතේ උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

(3) “තැනැත්තා” යන අර්ථ නිරූපණයේ “යම් සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් අදහස් වේ;” යන වචන වෙනුවට “යම් සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ යම් හවුල් ව්‍යාපාරයක් ද ඇතුළත් වේ;” යන වචන ආදේශ කිරීමෙන්.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ “උපලේඛනය” පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

(1) මෙහි “උපලේඛනය” “පළමු උපලේඛනය” ලෙස නැවත නම් කිරීමෙන්;

(2) එම උපලේඛනයේ I වන කොටසේ —

(අ) “(xiii) වන අයිතමයෙහි, “ඖෂධීය ද්‍රව්‍ය; සහ” යන වචන වෙනුවට “ඖෂධීය ද්‍රව්‍ය;”

(ආ) (xv) වන අයිතමයෙහි, “භාවිතා කිරීම සඳහා වූ යම් ද්‍රව්‍යයක්;”, යන වචන වෙනුවට “භාවිතා කිරීම සඳහා වූ යම් ද්‍රව්‍යයක්;”

(ඇ) අයිතම (xv) ට පසු, පහත දැක්වෙන අයිතම එකතු කිරීමෙන්:—

“(xvi) රටට සිදුවන ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන අදාළ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, රජයට ලැබෙන විදේශ අරමුදල් හෝ පරිත්‍යාග මගින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති සඳහා භාණ්ඩ ආනයනය හෝ සැපයීම;

(xvii) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 2714 යටතේ වර්ගීකරණය කරන ලද බිටුමන්;

(xviii) 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ හෝ එම කාර්යය සඳහා පළාත් සභා පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි කාර්යය සඳහා වූ වෙනත් අදාළ පනත් මගින් ලියාපදිංචි වූ සමුපකාර සමිතියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියා පදිංචි කොට ඇති ලක් සතොස සමාගම විසින් භාණ්ඩ ආනයනය හෝ විකිණීම;

(xix) සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8701. 10.10, 8701. 10. 90, 8701. 90.10 සහ 8701. 90. 20 යටතේ වූ ට්‍රැක්ටර්;

(xx) ඖෂධ නිෂ්පාදනය සඳහා අදාළ රජයේ ආයතන විසින් අනුමත කරන ලද, අමුද්‍රව්‍ය හෝ ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය;

(xxi) 2010 මාර්තු මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි රත්‍රං ආනයනය;

(xxii) 2010 ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට වැඩදායි වන බව සැලකිල්ලට ගනිමින්, මුදල් විෂයයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද, විශාල පරිමාණයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වැඩ සම්පූර්ණ කිරීමෙන් පසු නැවත අපනයනය කිරීමේ පදනම මත පිරියත, යන්ත්‍ර උපකරණ, තාවකාලික පදනම මත ලංකාවට ආනයනය කිරීම;

(xxiii) 2010 ජුනි මස 1 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 4907.00.90, යටතේ වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු;

(xxiv) ආයුර්වේද ඖෂධ නිසන්තුවට අයත් ආයුර්වේද නිෂ්පාදන සඳහා වූ අදාළ බලධරයා විසින් අනුමත කරන ලද, ආයුර්වේද නිෂ්පාදන සඳහා අමුද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය කිරීම;

(xxv) ආනයනය කිරීමේ දී සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0102.10 හෝ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 0104.20.10 යටතේ වූ නුමුහුන් අභිජනන කාර්යය සඳහා වූ සතුන්, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8434.10 යටතේ වූ කිරි දොවන යන්ත්‍ර සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8434.20 යටතේ වූ කිරිපට්ටි යන්ත්‍ර සූත්‍ර සහ සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 8434.90 යටතේ වූ අමතර කොටස් (2011.01.18 දින සිට ක්‍රියාත්මක වනු ඇත);

(xxvi) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියම කරන ලද නියමයන් සහ කොන්දේසිවලට යටත්ව රුපියල් විසිපන් දහසකට වැඩි නොවන අගයකින් යුතු ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධිත සාම්පල් ආනයනය කිරීම.”.

(3) මෙම උපලේඛනයේ II කොටසේ —

(අ) අයිතම (vii) හි, "උප කොන්ත්‍රාත්කරුවකු නොවන ඉදිකිරීම කොන්ත්‍රාත්කරුගේ සේවා;" යන වචන වෙනුවට,

"එම සේවා—

(i) 2011 ජනවාරි මස 1 වන දිනට පෙර කාලසීමාව තුළ උපකොන්ත්‍රාත්කරුවකු නොවන කොන්ත්‍රාත්කරුවකුගේ සේවා; හෝ

(ii) 2011 ජනවාරි මස 1 වන දිනට හෝ ඉන්පසුව කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු ඉදිකිරීම් සේවා සැපයීම".

යන වචන ආදේශ කිරීම මගින්;

(ආ) අයිතම (xii) හි, "යම් හෝටලයක්, අමුත්තන්ගේ නිවාසයක්" යන වචන වෙනුවට "2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පෙර අවසන් වූ කාලසීමාවක් සඳහා යම් හෝටලයක්, අමුත්තන්ගේ නිවසක්" යන වචන ආදේශ කිරීම මගින්;

(ඇ) අයිතම (xiii) හි "යම් දේශීය නිෂ්පාදන ද්‍රව්‍යයක;" යන වචන වෙනුවට "යම් දේශීය වගාවක"; යන වචන ආදේශ කිරීම මගින්;

(ඈ) අයිතම (xxiii) හි, "නියෝජිතයකුගේ සේවා" යන වචන වෙනුවට "නියෝජිතයකුගේ සේවා;" යන වචන ආදේශ කිරීම මගින්;

(ඉ) අයිතම (xxiii) ට පසු පහත දැක්වෙන නව අයිතම ඇතුළත් කිරීමෙන් :—

"(xxiv) 2010 ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, රටේ ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගනිමින් මුදල් ඇමතිවරයා විසින් අනුමත කරනු ලබන, විශාල පරිමාණයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, සඳහා විදේශ උපදේශන සේවා සැපයීම ;

(xxv) රටට සිදුවන ආර්ථික ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන, රජය විසින් ලබන විදේශ අරමුදල් හෝ ආධාරවලින් කරනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා සේවා සැපයීම;

(xxvi) ජාත්‍යන්තර ගමනාගමනය සම්බන්ධව වරායන් සඳහා හෝ ගුවන්යානා සඳහා සලසනු ලබන සේවා;

(xxvii) ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා නැව් නිපදවීම සම්බන්ධයෙන්, විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම්වලට යටත්ව සේවා සැපයීම;

(xxviii) විදුලි සංදේශ සේවය;

(xxix) දේශීයව නිෂ්පාදිත පරිගණක මෘදුකාංග සැපයීම;

(xxx) රජයේ දෙපාර්තමේන්තුවක්, අමාත්‍යාංශයක් හෝ රජයට සම්පූර්ණයෙන්ම අයත් ආයතනයක් කරනු ලබන සේවා සැපයීම්;

(xxxi) ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම සලසනු ලබන සේවා;

(xxxii) මිහින් එයාර් (පෞද්ගලික) සමාගම සලසනු ලබන සේවා;

(xxxiii) එයාර් ලංකා කේටරින් සමාගම සලසනු ලබන සේවා;

(xxxiv) 1972 අංක 5 දරන සමුපකාර සංගම් පනත හෝ පළාත් සභා ආයතනවල එවැනි සමාන ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි වූ සමුපකාර සමිතියක් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කොට ඇති ලක් සතොස සමාගම විසින් සලසනු ලබන සේවා;".

ප්‍රධාන ප්‍රඥප්තියට දෙවන උපලේඛනය ඇතුළත් කිරීම.

**9.** පහත දැක්වෙන නව උපලේඛනය, දෙවන උපලේඛනය ලෙස පළමු උපලේඛනයට ඉක්බිතිව ඇතුළත් කිරීම :—

**"දෙවන උපලේඛනය**

(3 වන වගන්තිය)

**මෙම පනත යටතේ බද්දට යටත්වන යම් තැනැත්තකුගේ ජාතිය ගොඩනැගීමේ බදු අනුප්‍රමාණ.**

**I කොටස**

| | |
|---|---|
| *2009 අප්‍රේල් මස 30 වන දිනෙන් අවසන්වන කාල පරිච්ඡේදය සඳහා බද්දට යටත් පිරිවැටුම් මත* | *සියයට 01 අනුප්‍රමාණය* |

**II කොටස**

2009 මැයි මස 1 වන දිනෙන් ආරම්භවන නමුත් 2010 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන්වන කාල පරිච්ඡේද සඳහා —

| | |
|---|---|
| (1) දේශීයව මිලදීගත් වී මගින් සහල් නිෂ්පාදනය මත (2009 ජූලි මස 1 වන දින සිට 2010 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ පිරිවැටුම හැර) බද්දට යටත් පිරිවැටුම මත- | සියයට 03 අනුප්‍රමාණය |
| (2) 2009 ජූලි මස 1 වන දින සිට 2010 දෙසැම්බර් මස 31 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ දේශීයව මිළදී ගත් වී මගින් සහල් නිෂ්පාදනය මත, බද්දට යටත් පිරිවැටුම- | සියයට 1.5 අනුප්‍රමාණය |

**III කොටස**

2011 ජනවාරි මස 1 වන දින හෝ එයට පසු ආරම්භවන ඕනෑම කාර්තුවක් සඳහා—

| | |
|---|---|
| (1) (යම් ද්‍රව්‍යයක් තොග හෝ සිල්ලර වෙළෙඳාම මත වූ පිරිවැටුම හැර) බද්දට යටත් පිරිවැටුම මත- | සියයට 02 අනුප්‍රමාණය |
| (2) යම් ද්‍රව්‍යයක් තොග හෝ සිල්ලරට විකිණීම මත වූ බද්දට යටත් පිරිවැටුම මත- | |
| (අ) යම් බෙදාහරින්නකුගේ බද්දට යටත් පිරිවැටුමේ හතරෙන් තුනක ප්‍රමාණයට | නැත. |

| | |
|---|---|
| (ආ) බෙදාහරින්නකුගේ පිරිවැටුම හැර ඕනෑම භාණ්ඩයක (තොග හෝ සිල්ලර වෙළෙඳාම මත) වූ බද්දට යටත් පිරිවැටුමෙන් භාගයක ප්‍රමාණයට. | නැත. |
| (ඇ) ඉතිරි බද්දට යටත් පිරිවැටුම මත- | සියයට 02 අනුප්‍රමාණය |

දෙවන උපලේඛනයේ III වන කොටසේ කාර්ය සඳහා "බෙදාහරින්නා" යන්නට 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 13 වන වගන්තියෙන් දෙන ලද අර්ථකථනය අදහස් වේ.

*ආදායම් පළාත් සභාවට වෙන් කිරීම.*

**10.** කොමසාරිස් ජනරාල්වරයා විසින් ජාතිය ගලවා ගැනීමේ බද්ද ලෙස එකතු කරන ලද මුලු මුදලින් සියයට තිස්තුනයි තුනෙන් එකක් අදාළ පළාත් සභාවට එම කාල පරාසයන්හි දී, මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් එම එක් එක් පළාත් සභාවට අවශ්‍යවන අයවැය අවශ්‍යතාවන් සලකා දැනුම් දෙනු ලබන පරිදි කළ යුතු ය.

*ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් බදු ගෙවීමෙන් නිදහස් කිරීම.*

**11.** රුපියල් මිලියන සියය නොඉක්මවන වාර්ෂික පිරිවැටුමක් සහිත, යම් ව්‍යාපාරයක් කරගෙන යන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, 2010 දෙසැම්බර් මස 31 වන දිනයෙන් හෝ ඊට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාර්තුවක් සඳහා මේ පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු මුදල් ගෙවීම යම් අර්බුදකාරී වාතාවරණයක් පැවතීම නිසා හෝ එවැනි යම් තැනැත්තකුගේ හෝ හවුල් ව්‍යාපාරයේ මූල්‍යමය ගැටලු පැවතීම හේතුවෙන් පැහැර හරිනු ලැබ ඇති විටදී, එවැනි යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් මේ පනත යටතේ ගෙවීම පැහැර හැර ඇති ඒ බද්ද ගෙවීමෙන් නිදහස් විය යුතු ය:

එසේ වුව ද, දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා විසින්, ඒ තත් කාර්ය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, ගෙවීම පැහැර හැර ඇති බදු මුදල සම්බන්ධයෙන් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය වෙත නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, නිදහස් කිරීමේ සහතිකයක් නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් වෙත ද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, 2011 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භවන යම් අනාගත බදු අයකළ හැකි කාර්තුවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ තමාට ගෙවීමට සිදු විය හැකි සියලු බදු ගෙවීම සඳහා වගකීමට බැඳෙන බවට වන ලිඛිත පොරොන්දුවක් ඊට සමගාමීව දේශීය ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

වගකීමෙන් මුක්ත කිරීම.

**12.** 2011 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව සහ මේ පනත ආරම්භවන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන සහ 5 වන වගන්ති යටතේ අවස්ථාවෝචිත පරිදි ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනතේ විධිවිධාන අදාළ වන යම් තැනැත්තකුගෙන් මේ පනතේ 3 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති බදු මුදලක් එකතු කරන අවස්ථාවක දී ඒ එකතු කිරීම සියලු කාර්යයන් සඳහා වලංගු ලෙස සිදු කර ඇති බව හා කරනු ලබන ලෙසත් සලකනු ලැබිය යුතු අතර, ඒ බදු එකතු කිරීම සම්බන්ධයෙන් සියලු සිවිල් හෝ අපරාධ නඩු පවරනු ලැබීමට එරෙහිව අවස්ථාවෝචිත පරිදි ආදායම් කොමසාරිස් - ජනරාල්වරයා හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙයින් වගකීමෙන් මුක්ත කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**13.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.